---

කුලියාපිටිය නගර සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 11 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මැයි 05 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කුලියාපිටිය නගර සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ). ස්ථාවර වත්කම් ලේඛන අනුව සමාලෝචිත වර්ෂයට අදාලව යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිළදී ගැනීම් රු.436,964 ක් වුවත්, ජ'නල් සටහන් 2 මගින් සමාලෝචිත වර්ෂයට අදාලව රු.3,072,904 ක ප්‍රමාණයක් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමෙහි යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිළදී ගැනීම් ලෙස දක්වා තිබුණි.

(ආ). ජ'නල් සටහන් 03 අනුව සමාලෝචිත වර්ෂයට අදාලව මෝටර් රථ හා කරත්ත මිළදී ගැනීම් ලෙස රු.3,472,356 ක් ප්‍රාග්ධනිත කර පැවතියද සමාලෝචිත වර්ෂයට අදාලව මෝටර් රථ හා කරත්ත මිළදී ගැනිමක් සිදුව නොතිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂ වලට අදාලව ප්‍රාග්ධන ගත නොවූ මෝටර් රථ හා කරත්ත වල වටිනාකම රු.272,190 ක් පමණක් විය.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

තැන්පතු ගිණුම් විෂය යටතේ අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු..20,512,152 ක් ව අතර, උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.24,018,031 ක් විය.

1.3.3 පැහැදිලි නොකළ වෙනස්කම්

විශ්‍රාම වැටුප් අරමුදලේ ගිණුම් විෂයට අදාලව පැහැදිලි නොකල රු.149,496 ක ශේෂයක් පැවතුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතුව ගිණුම් ශේෂ 2 ක වටිනාකම රු.10,630,542 ක් විය.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

---------------------------------------------

උපලේඛණ හා කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.10,905,608 ක් වූ ගණුදෙනු 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.10,312,842 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.15,874,920 ක් විය.

2.2 <u>මූල්‍ය පාලනය</u>

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 දක්වා ඇති පරිදි අත්තිකාරම් මුදල් අදාල කාර්ය නිමවූ විගසම පියවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ අවස්ථා 03 ක් යටතේ ලබාදී තිබූ රු.64,970 ක අත්තිකාරම් මුදල් පියවීමට මාස 11 සිට 21 ක කාල ප්‍රමාදයක් ඇතිව සිදුව තිබුණි.

(ආ). 2006 වර්ෂයේ සිට පවතින දැනට සේවයේ නියුතු නොවන අනියම් සේවකයන් වෙත ලබාදෙන ලද උත්සව හා විශේෂ අත්තිකාරම් රු.35,277 ක ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් වී නොතිබුණි.

(ඇ) බැංකු ගිණුම් 02 ක ට අදාලව නිකුත් කල නමුත් ගෙවීම සඳහා මාස 6 කට වැඩි කාලයක් ඉදිරිපත් නොවූ රු. 3,195 වටිනා චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි අංක 396 විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) සේවක ණය බැංකු ගිණුමට අදාලව තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ රු. 1,007 ක් වටිනා චෙක්පතක් පැවතුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තු ගත | 2010 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තු ගත | 2009 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 14,380 | 12,947 | 10,019 | 10,509 | 11,819 | 7,790 |
| (ii) | බදුකුලී | 8,863 | 6,969 | 2,314 | 8,139 | 9,765 | 4,206 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 11,432 | 11,639 | 122 | 8,171 | 9,121 | 329 |
| (iv) | වෙනත් ආදායම් | 43,363 | 9,155 | 8,608 | 37,402 | 37,099 | 11,833 |
| | එකතුව | 78,038 | 40,710 | 21,063 | 64,221 | 67,804 | 24,158 |

2.3.2 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.7,819,862 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3.3 විනෝද බදු

පළාත් පාලන කොමසාරිස්ගේ 2007 ඔක්තෝබර් 01 දිනැති අංක LG/MA/13 විනෝද බදු ලිපිය අනුව 2006 මැයි 31 දින සිට විනෝද බදු මුදල් ප්‍රතිපූරණය අත් හිටුවා තිබූ බැවින් 20% වූ සම්පූර්ණ විනෝද බදු ප්‍රමාණයම සිනමා ශාලාවලින් අයකිරීමට සභාව කටයුතු කර තිබුණි. සිනමා ශාලා හිමියන් ඊට එකඟ නොවීම හේතුවෙන් 10% ප්‍රමාණය පමණක් ගෙවන ලෙස ඉල්ලා සිටියද සිනමාහල් හිමියන් එලෙස බදු මුදල් නොගෙවීම සහ නගර සභාව විසින් 2010 ජනවාරි 28 දිනැති ගැසට් නිවේදනයේ සඳහන් පරිදි ප්‍රවේශපත්‍ර වල වටිනාකමින් 20% ක විනෝද බද්දක් බිල් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට සිනමාහල් දෙකකට අදාලව හිඟ විනෝද බදු ආදායම රු.1,441,342 ක් විය.

2.3.4. කඩ කාමර බදු

නගර සභාව සතු කඩ කාමරවලින් ගිවිසුම් ප්‍රකාරව හිඟ මුදල් අයකර නොගැනීම මත මාස 04 සිට 26 දක්වා කාලයකට අදාලව කඩ කාමර 58 ක රු.1,026,967 ක හිඟ කුලී ආදායම් ශේෂයක් පැවතුණි.

2.3.5 <u>ජල ගාස්තු</u>

(I) සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජල පවිත්‍රාගාරයෙහි පිරිසිදු කරන ජල ප්‍රමාණය හා බෙදාහැර් ජල ඒකක ප්‍රමාණය හඳුනාගත හැකි වන පරිදි ජලමනු කියවීමක් සිදුව නොතිබුණි. එමෙන්ම පිරිසිදු කළ ජල ඒකක ප්‍රමාණය හා ජල පාරිභෝගිකයින් වෙත බිල් කරන ප්‍රමාණයන් හා සභාවේ පැවති පොදු ජල කරාම 19 ක් යටතේ භාවිතා කරන ජල ප්‍රමාණය පිළිබඳ වෙනම හඳුනාගැනීමක් හෝ විශ්ලේෂණයක් නගර සභාව විසින් සිදුකර නොතිබුණි. සභාවේ ජල බිල්පත් නිරවුල් කිරීමට අදාලව සිදුකල නියැදි පරීක්ෂාවේදී ජල පාරිභෝගිකයන් 24 දෙනෙකු සඳහා මාසිකව සමාන ඒකක ප්‍රමාණයක් බිල්කිරීම් පැවතියද එසේ සථාවර ගාස්තු අයකිරීමට හේතු සොයා බලා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි

(II) 2009 දෙසැම්බර් 31 දිනට ජල බිල් කිරීම් ලේඛණ වලට අනුව ජල බිල්පත් ගෙවීම් පැහැර හරින ලද ජල පාරිභෝගිකයන්ගෙන් මාස 06 සිට 18 ක කාලය දක්වා අයවිය යුතු හිඟ ජල ගාස්තුව රු.1,329,001 ක් විය.

(III) නගර සභාව විසින් විවිධ කාල වකවානු වල ජල සැපයුම් විසන්ධි කර පවතී. 2009 ජනවාරි 01 දිනට පෙර සිට ජල පාරිභෝගිකයින් 17 දෙනෙකුගේ අයවිය යුතු රු.70,117 ක් වූ හිඟ ජල ගාස්තු ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පැවතුණි.

2.3.6 <u>දැන්වීම් පුවරු ගාස්තු</u>

2003 වර්ෂයට පෙර වර්ෂවල සිට පැවත එන රු.15,932 ක හිඟ දැන්වීම් පුවරු ආදායමක් පැවතුණි.

2.3.7 <u>වරිපනම් බදු</u>

සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.6,544,680 ක් ව පැවති අතර පසුගිය වර්ෂයන් හා සැසඳීමේදී එහි ක්‍රමික වර්ධනයක් දක්නට ලැබුණි. හිඟ අයකර ගැනීම සඳහා පැවති ආදායම් ප්‍රවර්ධන වැඩසටහන් 12 ක් යටතේ රු.578,280 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුල එකතු කර පැවතියද විගණනයේදී සිදුකල සෝදිසි පරීක්ෂාව අනුව කොට්ඨාශ 07 කට අදාලව රු.20,000 කට වැඩි හිඟ ශේෂයක් පවතින බදුකරුවන් 23 දෙනෙකු ද, කොට්ඨාශ 2 කට අදාලව කාර්තු 3 - 17 දක්වා පරාසයක් තුල හිඟ බදුකරුවන් 51 දෙනෙකු ද හඳුනාගත හැකි විය. මෙකී හිඟයන් අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170(2) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.4 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත රු.000 | තථ්‍ය රු.000 | විචලනය රු.000 | අයවැයගත රු.000 | තථ්‍ය රු.000 | විචලනය රු.000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 44,296 | 37,329 | 6,967 | 42,331 | 34,971 | 7,360 |
| අනෙකුත් | 23,824 | 19,928 | 3,896 | 19,778 | 16,658 | 3,120 |
| උප එකතුව | 68,120 | 57,257 | 10,863 | 62,109 | 51,629 | 10,480 |
| ප්‍රාග්ධන වියදම | 19,265 | 17,908 | 1,357 | 45,607 | 25,460 | 20,147 |
| මුළු එකතුව | 87,385 | 75,165 | 12,220 | 107,716 | 77,089 | 30,627 |

2.5 මානව සම්පත් කළමණාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 04 | 03 |
| ද්විතියික | 26 | 21 |
| ප්‍රාථමික | 85 | 70 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 78 |

2.6 වත්කම් කළමණාකරණය

2.6.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.22,259,882 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.14,455,866 ක් විය.

2.6.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.27,138 ක් විය.

2.6.3 සමීක්ෂණය නොකළ වත්කම්

සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොව 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ ගබඩා තොග වල වටිනාකම රු.13,280,902 ක් විය.

2.7 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

සභාව විසින් ජලමනු කියවීම හා හිඟ ජල ගාස්තු අයකර ගැනීම සඳහා සෞඛ්‍ය සහායිකාවන් 5 දෙනෙකුගේ සේවය ලබාගෙන තිබූ අතර, ඔවුන් විසන් ජල පාරිභෝගිකයන්ගෙන් ඍජුවම ජල ගාස්තු අයකර ගන්නා ක්‍රමවේදයක් නිරීක්ෂණය වූ අතර, ඒ මත ඔවුන් වෙත 10% ක කොමිස් මුදලක් ද සභාව විසින් ගෙවා තිබුණි. එලෙස 2010 වර්ෂය සඳහා මෙම ක්‍රියාවලිය වෙනුවෙන් එම සහායිකාවන් 5 දෙනාට රු.106,140 ක කොමිස් මුදලක් ගෙවා තිබුණි. මෙම කටයුතු සඳහා සභා අනුමැතිය ලැබී තිබුණ ද පළාත් පාලන කොමසාරිස්ගේ නිසි අනුමැතිය ලැබී නොතිබුණි.

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 6,043,886 ව තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසික වාරිකය ලෙස රු. 31,581 බැගන් එකී අරමුදල විසින් අය කර පැවතියද, එකී අය කිරීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න සභාව දැණුවත් වී නොතිබුණි.

2.9 කාර්ය සාධනය

(අ). වාර්ෂික අයවැය ලේඛණය මගින් පුනරාවර්තන වැය විෂයයන් 32 ක් සඳහා ප්‍රතිපාදිත රු.936,000 ක මුළු මුදලම අදාල කාර්යයට නොයොදා ඉතිරිව තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය තුල සුභ සාධක හා විවිධ වැඩසටහන් 15 ක් සඳහා රු.6,041,000 ක් අයවැය මගින් ප්‍රතිපාදනය කර පැවතියද එයින් ප්‍රයෝජනයට ගෙන තිබුනේ රු.1,903,448 ක ප්‍රතිපාදන පමණි.

(ඇ). විෂය අංක 52517 පොදු වෙළඳපල අළුත්වැඩියා වැය විෂය සඳහා අයවැය මගින් වෙන්කර තිබූ රු.500,000 ක ප්‍රතිපාදනයට අමතරව 52517(2) වැය විෂයය යටතේ රු.මි. 1.8 ක පරිපූරක ප්‍රතිපාදනයක් ලබාගැනීමට අදාලව අරමුදල් ප්‍රභවය නිශ්චිතව නොදක්වා සමුච්චිත අරමුදල ලෙස දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල ප්‍රාග්ධන ව්‍යාපෘති 50 ක් සඳහා රු.13,325,500 ක් ප්‍රතිපාදනය කර පැවතියද ඒ යටතේ අදාල ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය තුල ඉටුකර නොතිබුණි.

2.10 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි

03. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පාලනය
(ඈ) වත්කම් කළමණාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය